**බලපිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කසල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රු.78,000 කට මිලදී ගෙන තිබුණු දැන්වීම් පුවරු 10 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබීමෙන් ස්ථාවර වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වර්ෂයේ අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.6,904,942 ක දායක මුදල් ගිණුම් ගතකර නොතිබීමෙන් ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.46,248,459 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂ අතර එකතුව රු.9,853,657 ක අසමානතා නිරීක්ෂණය විය.

## 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.86,082,612 ක් වූ අතර, ඊට ඇතුළත් 2008 වර්ෂයට අදාළ එකතුව රු.5,375,414 ක් වූ හිඟ මුද්දර ගාස්තු ශේෂය නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂ 07 ක එකතුව රු.22,153,167 ක් වූ අතර, එම ශේෂයට 2013 – 2015 අතර කාලපරිච්ඡේදයට අයත් එකතුව රු.181,170 ක් වූ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු මුද්දර ගාස්තු දීමනා නිරවුල් කර නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.16,143,377 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත, ලී බඩු හා සවිකිරීම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ද, එකතුව රු.13,571,279 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ ද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(අ)** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | යොමුගත කාර්යයන් යටතට නොගැනෙන, ප්‍රාදේශීය සභාවේ සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහභාගී වූ චාරිකාවක් සඳහා සභා අරමුදලින් රු.300,000 ක් ලබා දී තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මු.රෙ.261(3) | මුදල් පොතේ ශේෂයක් නොතිබියදී රු.867,561 ක වටිනාකමකින් යුතු චෙක්පත් 14 ක් නිකුත් කර තිබුණි. |
| (ii) මු.රෙ.570 හා 571(1)(2) | වර්ෂ 02 ක කාලය ඉක්මවන ලද එකතුව රු.8,324,999 ක් වූ තැන්පත් ශේෂ 354 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.44,118,884 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.28,466,919 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,651,965 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉකුත් වර්ෂවල තත්ත්වය සමඟ සමාලෝචිත වර්ෂයේ තත්ත්වය සැසඳීමේ දී ජංගම අනුපාතයේ සහ ක්ෂණික අනුපාතයේ සාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කෙරෙන නමුත්, ලැබිය යුතු ශේෂ තුළ වසර 08 ක කාලයක් ඉක්ම වූ රු.5,375,414 ක් පැවැතීමෙන් අනුපාත වලින් පෙන්නුම් කෙරෙන ආකාරයේ ද්‍රවශීල තත්ත්වයක් නොමැති බව නිරීක්ෂණය වේ.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් හා බදු

වර්ෂය ආරම්භයට වූ රු.11,446,255 ක හිඟයෙන් සහ රු.4,030,732 ක බිල් කිරීම් වලින් සියයට 27 ක් පමණක් වර්ෂය තුළ අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.11,284,215 ක් තරම් ඉහළ අගයක් විය.

### 2.3.2 බදු කුලී

වර්ෂය ආරම්භයට පැවැති රු.1,147,907 ක හිඟයෙන් සහ රු.159,600 ක් වූ බිල් කිරීම් වලින් සියයට 12 ක් පමණක් වර්ෂය තුළ අයකර ගැනීම නිසා වර්ෂය අවසානයට හිඟ කුලී ශේෂය රු.1,147,839 ක් තරම් ඉහල අගයක් ගෙන තිබුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.71,854,145 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.1,608,633 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු සේවකයින් 06 දෙනෙකුගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.1,853,125 ක වියදම් දරා තිබුණි.

(ii) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 08 ක පැවැති පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) විධිමත් ස්ථාන මාරුවීම් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සභාවේ නිලධාරීන් හා සේවකයන් අඛණ්ඩව අවුරුදු 20 ත් 15 ත් අතර සේවයේ යෙදී තිබුණි.

**(ආ) සේවක ණය**

එකතුව රු.102,764 ක් වූ සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සභාව විසින් පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම් 04 ක සමාලෝචිත වර්ෂය තුළ පැවති සාමාන්‍ය මාසික ශේෂය රු.3,089,767 ක් වූ නමුත්, එම අතිරික්ත මුදල් ආයෝජනය කර අතිරේක ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බලප්‍රදේශයෙන් සියයට 60 ක් ආවරණය වන පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදු කර තිබුණු නමුත්, කසළ වර්ග කර ලබාගෙන නොතිබුණි. එකතු කරන කසළ මාදු ගඟේ අතු ගංඟාවක් ආශ්‍රිත ප්‍රදේශයේ පුද්ගලික ඉඩමකට අවිධිමත්ව බැහැර කිරීම ජනතාවගේ සෞඛ්‍යයට බාධා ඇතිවිය හැකිව තිබුණි. කසළ බැහැර කරන භූමියට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.18,903,213 ක් වූ ඉතිරිවීම් ද, එක් වියදම් විෂයයක රු.56,985 ක් වූ අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 05 ක එකතුව රු.8,806,746 ක් වූ ළඟාකර නොගත් ඉලක්ක ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01 /නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයන් පවත්වා නොතිබුණි. |
| | | (iii) | සභාව සතු ප්‍රජා ශාලා, සුසාන භූමි සහ පොදු ස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් කර ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | සේවක මණ්ඩල කළමනාකරණය | | පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමටත්, අතිරික්ත සේවකයන් විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | හිඟ වරිපනම් බදු සහ කුලී අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | | | පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | බදු අයකල හැකි ආයතනවලින් කසල බදු අයකර ගෙන නොතිබුණි. |
| | | (iv) | අතිරික්ත මුදල් ආයෝජනය කර අතිරේක ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අදාළ උපලේඛන වල දැක්වෙන ශේෂ අතර, පවතින වෙනස්කම් නිවැරදි කර නොතිබුණි. |
| | | (iii) | ගිණුම් ශේෂ අඩුවෙන් මෙන්ම වැඩියෙන් දක්වන ලද අවස්ථා පැවැතුණි. |
| (ඉ) | කළමනාකරණ දුර්වලතා | (i) | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | ස්ථාන මාරු කිරීමකින් තොරව අවුරුදු 15 සිට අවුරුදු 20 අතර කාලයක් කාර්යය මණ්ඩල සාමාජිකයින් සේවයේ යොදවා තිබුණි. |